කම්කරුවන්ගේ (ප්‍රධාන වශයෙන් වැවිලි අංශයේ) නාමික වැටුප් සියයට 28·6 කින් වැඩි විය. අනෙක් අතට කර්මාන්ත හා වාණිජ කටයුතු වල නියුතු සේවකයන්ගේ වැටුප් සියයට 10·5 කින් වැඩි විය. 1976 දී මෙම සේවක වැටුප් වැඩිවීම සියයට 2·6 ක් පමණ විය. 1977 වර්ෂයේදී සිදු වූ මෙම වැටුප් වැඩිවීම් වලට මූලික හේතුව 1977 දෙසැම්බර් මස සිට බල පැවැත්වෙන පරිදි අයවැය ලේඛනයෙන් ප්‍රදානය කරනු ලැබූ වැටුප් වැඩි කිරීමයි.

නිවැරදි පාරිභෝගික මිල දර්ශකයක් නොමැති හෙයින් මූර්ත වැටුප් වල වෙනස්වීම තක්සේරු කළ නොහැක. ගම්‍ය මිල දර්ශකය මේ සඳහා සුදුසු මිණුම ලෙස යොදගත හොත් වැවිලි අංශය හැර අනෙක් සියළු අංශයන් හි සේවකයන්ගේ මූර්ත වැටුප් 1977 අවසාන වන විට අඩු වී ඇති බව සඳහන් කළ හැකිය.

## සේවා නියුක්තිය

පසුගිය වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සඳහන් වන පරිදි පිළිගත හැකි සහ නොකඩවා ලැබෙන දත්තයන් නොමැති හෙයින් සේවා නියුක්තිය හා සේවා වියුක්තිය පිළිබඳ පැහැදිලි විශ්ලේෂණයක් කිරීම අපහසුය.[1]

1971 සංගණන දත්ත අනුව දශ ලක්‍ෂ 12·7 ක්වූ මුළු ජනගහණයෙන් ශ්‍රම බලකායට අයත් සංඛ්‍යාව දශ ලක්‍ෂ 4·5 ක් විය. 1973 මුල් භාගයේ මහ බැංකුව මගින් පැවැත්වූ පාරිභෝගික මූල්‍ය සමීක්‍ෂණය අනුව ශ්‍රම හමුද ඇස්තමේන්තුව මෙම සංඛ්‍යාවට වඩා සුළු වැඩි වීමක් පෙන්නුම් කරයි. සංගණන දත්තයන් අනුව 1971 දී සේවා වියුක්ති වූවන්ගේ සංඛ්‍යාව දශලක්‍ෂ 0·8 ක් වූ අතර 1973 පාරිභෝගික මූල්‍ය සමීක්‍ෂණය අනුව මෙම සංඛ්‍යාව දශලක්‍ෂයක් විය. 1977 වර්ෂයේ දී තරුණයන් 170,000 පමණ ශ්‍රම හමුදවට ඇතුළත් වියහැකි අතර පුද්ගලයන් 50,000 ක් පමණ ශ්‍රම හමුදවෙන් ඉවත් වියහැකි බව ජනගහණයේ වයස් ව්‍යුහය හා වයස් විශිෂ්ඨ ක්‍රියාකාරි අනුපාතිකයන් අනුව දක්විය හැකි වේ. පසුගිය වර්ෂයේ ඇස්තමේන්තු කරන ලද ලක්‍ෂයක ප්‍රමාණය සමග සැසඳීමේ දී මෙම සංඛ්‍යා මගින් නව රැකියාවන් 120,000 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා ඉල්ලුමක් ඇති කෙරුණි. ජනගහණයේ වයස් ව්‍යුහය හා වයස් විශිෂ්ඨ ක්‍රියාකාරි අනුපාතයන් සලකා බැලීමේ දී 1977 අවසාන වන විට සේවා වියුක්ති ශ්‍රම බලකාය පුද්ගලයන් දශ ලක්‍ෂයද ඉක්මවන බව පෙනේ.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව කරනු ලබන වාර්ෂික සමීක්‍ෂණය අනුව 1977 වර්ෂයේ දී රාජ්‍ය දෙපාර්තමේන්තු හා අර්ධ රාජ්‍ය ආයතනයන් හි සේවා නියුක්තියේ සාමාන්‍ය වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබේ. එහෙත් මෙම වැඩිවීම 1976 වර්ෂයේ වැඩිවීමට වඩා අඩු වැඩිවීමකි. රාජ්‍ය දෙපාර්තමේන්තුවල සේවා නියුක්තිය, 16,626 කින් හෙවත් පසුගිය වර්ෂය මත සැලකීමේ දී සියයට 4·1 කින් 1977 වර්ෂයේ දී වැඩි වී තිබේ. 1976 වර්ෂයේ සියයට 4·6 ක වැඩිවීමට වඩා මෙය සුළු වශයෙන් අඩු වැඩිවීමකි. සේවා නියුක්තිය වැඩිවීමට ප්‍රධාන මාර්ගයන් වූයේ ගුරු වෘත්තිය (සියයට 42 ක්) හා සුළු සේවක ශ්‍රෙණි (සියයට 28) යි. අර්ධරාජ්‍ය ආයතනයන් හි (රාජ්‍ය අංශය හා ව්‍යවස්ථාපිත මණ්ඩලයන් හි) සේවා නියුක්තිය මෙම වර්ෂයේ දි 1976 ට වඩා සියයට 5·9 කින් හෙවත් 31,897 ක වැඩිවීමක් දක්වයි. 1976 මෙන්ම මෙම වැඩිවීමෙන් විශාල ප්‍රමාණයක් සිදුවී ඇත්තේ 1972 දී හා 1975 දී ඇතිකරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රමය යටතේ ඉඩම් පවරාගනු ලැබූ රාජ්‍ය අංශයේ වතු පාලන ආයතන වලය.

ප්‍රමාණවත් පරිදි දත්තයන් නොමැති හෙයින් සංවිධිත පුද්ගලික අංශයේ සේවා නියුක්තියේ වෙනස්වීම් මැනීම සඳහා සේවක අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරි ගිණුම් වල ප්‍රමාණය ආදේශකයක් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ. අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි වී ඇති සේව්‍යායතන සහ සේවක සංඛ්‍යාවන් පිළිබඳව ලබාගත හැකි ආසන්න දත්තයන්

1. සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය පිළිබඳ දත්තයන් නොකඩවා රැස්කර නොමැත. දනට තිබෙන දත්තයන් සංගණන වාර්තා වලින් සහ ශ්‍රම බලකාය පිළිබඳ දත්ත රැස්කිරීම මූලික අරමුණ නොවූ කලින් කල පවත්වන ලද විවිධ සමීක්ෂණ වාර්තා වලින් ලබාගත් ඒවා වේ.

ඇත්තේ 1976 වර්ෂය සඳහා ය. 1976 දී අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරි ගිණුම් පසුගිය වර්ෂය සමඟ සසඳන විට 34,403 කින් හෝ සියයට 4 කින් අඩුවී ඇත. වැවිලි අංශයේ 56,318 කින් ද, තැනිම් අංශයේ 681 කින් ද, වර්ග නොකළ අංශයන්හි 15,832 කින් ද ගිණුම් ප්‍රමාණය අඩුවී ඇත. අනෙක් අතට සෙසු අංශයන්හි ගිණුම් ප්‍රමාණය 38,428 කින් වැඩිවී ඇත. වැවිලි අංශයේ සේවා නියුක්තිය දැඩි ලෙස අඩුවීමට බලපෑ ප්‍රධාන කරුණ වූයේ ඉන්දියානු කම්කරුවන් ආපසු යැවීමයි. තැනිම් අංශය සහ වර්ග නොකළ අංශයන්හි සේවා නියුක්තිය අඩුවීමට මහත් සේ හේතුවී ඇත්තේ මෙම අංශයන් හි සේවකයින් විදේශ රැකියා-වන් සඳහා (විශේෂයෙන් මැද පෙරදිග රාජ්‍යයන්ට) මෙරටින් පිටවී යාමය.

ආයතනික පුද්ගලික අංශයේ සේවා නියුක්තියේ අඩුවීම ද සැලකිල්ලට ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තු අර්ධ රාජ්‍ය ආයතන හා සංවිධිත පුද්ගලික අංශය යන සියලු අංශයන්හි සේවා නියුක්ති ප්‍රමාණයේ වැඩිවීම 40,000 ක් පමණ වේ. ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩලයන් හා ජනාවාස පිළිබඳව දත්ත ලබා ගැනීමට නොහැකි නිසා මෙම සංඛ්‍යාවට එම ආයතන-යන්ගේ සේවා නියුක්තියේ සිදුවූ වෙනස්වීම් ඇතුළත් කොට නොමැත. එමෙන්ම ආයතනික නොවන පුද්ගලික අංශයේ සහ දේශීය කෘෂිකර්ම අංශයේ සේවා නියුක්තියේ වැඩිවීමද මෙම ගණනයේ දී සලකා බලා නොමැත.

ශ්‍රම බලකායේ වර්ධනයට සැසඳෙන අයුරින් ප්‍රමාණවත් සේවා නියුක්ති අවස්ථාවන් ඇති කිරීම, කාලයක් තුල රජයේ ප්‍රමුඛතාවය ලැබූවකි. මේ සඳහා ඉඩම් අයිතියේ සහ අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිසංස්කරණයන් කර තිබෙන අතර, ශ්‍රම සූක්ෂම ශිල්පීක්‍රම අනුගමනය කිරීමට ද උනන්දුවක් දක්වා ඇත. එහෙත් විශේෂයෙන්ම පුද්ගලික අංශයේත්, පොදුවේ මුළු ආර්ථික යේත් සිදුවූ ඉතා අඩු වර්ධනය හේතුවෙන් සේවා වියුක්ත වූවන්ගේ සංඛ්‍යාව වේගයෙන් වැඩිවී ඇත. උගත් තරුණයින් විශේෂ කොට ජනතාව විසින් රාජ්‍ය අංශයේ රැකියාවන් සඳහා දක්වන දැඩි කැමැත්ත නිසා රාජ්‍ය අංශයේ ආයතනවල උපරිම සේවා නියුක්ති ප්‍රමාණයද අභිබවා රැකියා කරන්නවුන් ගේ ප්‍රමාණය වැඩිවී ඇත. 1977 දී ප්‍රකාශිත නව ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමෙන් පසුව රාජ්‍ය අංශයේ ආයතන වල දක්නට ඇති මෙම පීඩනය ලිහිල් වෙතැයි සිතිය හැකිය. නිදහස් ආර්ථික ක්‍රමය මගින් නව ආයෝජනයන් ඇති කිරීම සහ කර්මාන්තයන් හි භාවිතයට නොගත් ධාරිතාව ප්‍රයෝජනයට ගැනීම සිදුවිය යුතුය. පෙරදී අවුරුදු 30 කට සැලසුම් කොට තිබූ මහවැලි යෝජනා ක්‍රමය එයට වඩා කෙටි කාලයකින් අවසන් කිරීමට කටයුතු කිරීමත්, එමගින් දශ ලක්ෂයකට රැකියා සැපයීමට යෝජනා කිරීමත් නිසා සේවා නියුක්තියේ වැඩිවීමක් බලාපොරොත්තු විය හැකිවේ. තවද අපනයනයට නැඹුරු වූ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා විදේශීය ආයෝජනයන් දිරිමත් කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ගය මගින් ද සේවා නියුක්තියේ වැඩිවීමක් ඇතිවිය යුතුවේ. ඒ අතර සේවා වියුක්ත වූවනට තාවකාලික සහනයක් වශයෙන් 1978 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් සහනාධාරයක් ලෙස මසකට රුපියල් 50 ක දීමනාවක් ගෙවීමට රජය තීරණය .කොට තිබේ.

පුහුණු වූ මිනිස් බලය, විදේශ රැකියාවන් සඳහා යෑම අනාගතයේ දී මුහුණ දීමට සිදුවන විශේෂ වූ වැදගත් ප්‍රශ්ණයකි. අවාසනාවකට මෙන් මෙසේ විදේශගත වන සේවකයින්ගේ ප්‍රමාණය සහ ඔවුන් ලබා ඇති ප්‍රාගුණ්‍යතාවයන් පිළිබඳ සවිස්තර දත්තයන් නොමැත. කාලයක් තිස්සේ විද්‍යා, ඉංජිනේරු සහ වෛද්‍ය ක්ෂෙත්‍රයන්ට අයත් වූ පිරිස් සාපේක්ෂ වශයෙන් අඩු ප්‍රමාණයකින් විදේශ රැකියාවන් සඳහා ගියද, 1970 ගණන් වල මුල් භාගයේ දී ඛණිජ තෙල් මිල වැඩිවීම නිසා මැද පෙරදිග රටවල් වල ඇතිවූ ආර්ථික සෞභාග්‍යය හේතුවෙන් විදුලි ශිල්පීන්, මිකැනික්වරුන්, වැල්ඩින් කරුවන් වැනි පුහුණු මධ්‍යම මට්ටමේ ශ්‍රේණිවල ශිල්පීන් සහ කාර්මිකයන් විශාල වශයෙන් රටින් බැහැරව යාම ආරම්භ කොට ඇත. ඉන්දියාව සහ එක්සත් අරාබි සමූහාණ්ඩුව වැනි රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද මෙම පුද්ගලයින් විසින් කරනු ලබන විදේශ විනිමය ප්‍රේෂණයන් නිසා අත්‍යාවශ්‍යව ඇති ගෙවුම් ශේෂයේ වර්ධනයක් සිදුවිය හැකිය. තවද මෙම සංක්‍රමණිකයින් නිසා ස්වදේශීය වශයෙන් රැකිරක්ෂා ප්‍රශ්ණය තරමක් ලිහිල් වීමට ද ඉඩ ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රයත්නයන් සඳහා

එවැනි පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාවයේ ප්‍රමාණය අනුව සහ එවැනි ශ්‍රමිකයින් පුහුණු කිරීමට ගතවන කාලයේ දීර්ඝ කමත් ඒ සඳහා අවශ්‍ය සම්පත් වල ප්‍රමාණයත් සැලකිල්ලට ගෙන සංවර්ධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන අවස්ථාවන්හි අවශ්‍ය ප්‍රමාණයේ පුහුණු ශ්‍රමිකයින් නොමැති කම බාධාවක් නොවීමට සහතික වන අයුරින් කටයුතු කිරීම වැදගත් වේ. විස්තරාත්මක ශ්‍රම බල සැලැස්මක් සකස් කිරීමේ කර්තව්‍යයට පදනමක් වශයෙන් පුහුණු ශ්‍රමිකයින් විදේශගත වීමේ ප්‍රශ්ණය සවිස්තර ලෙස ගණනය කිරීම හා අධ්‍යයනය කිරීම පිළිබඳව රජයේ ප්‍රමුඛතාවය ලැබිය යුතුය.

## විදේශීය වෙළෙඳාම

රේගු වාර්තා අනුව, 1977 දී ශ්‍රී ලංකාව පිට පිටම දෙවන වරටත් වෙළෙඳ තුලනයේ හෙවත් ශේෂයේ අතිරික්තයක් අත් දුටුවේය. අපනයන ඉපැයීම්, 1976 දී වූ රුපියල් දශලක්ෂ 4,815 සිට 1977 දී රුපියල් දශ ලක්ෂ 6,638 දක්වාත්, ආනයන ගෙවීම් රුපියල් දශලක්ෂ 4,645 සිට[1] රුපියල් දශලක්ෂ 6,007 දක්වාත් වැඩි විය. 1977 අතිරික්තය මීට පෙර නොවූ විරූ අතිරික්තයක් වූ අතර, එය රටේ මුළු අපනයන ඉපැයුමෙන් සියයට 10 ක් පමණ විය.

සමහර රාජ්‍ය ආයතනයන්ගේ ගණුදෙනු රේගුව ප්‍රමාදවී වාර්තා කරන නිසා, ශ්‍රී ලංකා මහ බැංකුව අතීතයේදී මෙන්ම, මෙවරත් විදේශ සමග කරන ලද වෙළෙඳ කටයුතු පිළිබඳ නිවැරදි සටහනක් ලබා ගැනීම සඳහා රේගු දත්ත රාජ්‍ය ආයතනයන්ගේ සංඛ්‍යා සමග ගලපා ඇත. පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙහි දැක්වෙන්නේ රේගු දත්ත සහ එසේ ගලපන ලද දත්තයන්ය.

**8 වැනි සංඛ්‍යා සටහන**

රුපියල් දශලක්ෂ

| වසර | ආනයන | | අපනයන | | වෙළෙඳ ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | රේගු සංඛ්‍යා | ගලපන ලද | රේගු සංඛ්‍යා | ගලපන ලද | රේගු සංඛ්‍යා | ගලපන ලද |
| 1974 .. | 4,554 | 4,770 | 3,472 | 3,503 | − 1,082 | − 1,267 |
| 1975 . | 5,251 | 5,196 | 3,933 | 3,969 | − 1,318 | − 1,228 |
| 1976[1] .. | 4,645 | 4,902 | 4,815 | 4,840 | + 170 | − 62 |
| 1977 .. | 6,007 | 6,061 | 6,638 | 6,570 | + 631 | + 509 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව.
ශ්‍රී ලංකා මහ බැංකුව.

ගලපන ලද දත්ත අනුව, 1976 දී රුපියල් දශලක්ෂ 170 ක් වූ රේගු වෙළෙඳ අතිරික්තය රුපියල් දශ ලක්ෂ 62 ක කුඩා හිඟයක් බවට පත් වේ. 1977 දී වෙළෙඳ අතිරික්තය රුපියල් දශලක්ෂ 509 ක් ලෙස වාර්තා වූ අතර, එය අපනයන ඉපයීම් වලින් සියයට 8 ක් විය.

1977 වැඩි දියුණු වූ වෙළෙඳ තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ පිට පිටම දෙවැනි වර්ෂය සඳහා වෙළෙඳ අනුපාතයේ ඇති වූ වැඩි දියුණු වීමයි. 1976 දී සියයට 35 ක වැඩි දියුණුවක් පෙන්වන තෙක් 1968 සිට වෙළෙඳ අනුපාතය අඛණ්ඩව පිරිහෙමින් තිබුණි. මෙයට හේතු වූයේ අපනයන මිල සියයට 20 කින් වැඩිවීමත් ආනයන මිල සියයට 12 කින් අඩුවීමත්ය. සියයට 23 ක ආනයන මිල වැඩිවීම අභිබවා ගිය සියයට 60 ක අපනයන මිල වැඩිවීම නිසා 1977 දී තවදුරටත් වෙළෙඳ අනුපාතය සියයට 31 කින් වැඩිදියුණු විය. අපනයන මිල දර්ශකයේ සියයට 80 විශාල වැඩිවීම, වෙළෙඳ අනුපාතය වැඩිදියුණු වීමට සැහෙන දුරට හේතු විය. පහත දැක්වෙන 9 වැනි සංඛ්‍යා සටහන සමස්ථ තත්වයන් පිළිබඳ සාරාංශයක් සපයයි.

1. සංශෝධිත රේගු දත්ත
2. ධාන්‍ය සහ සීනි ආනයන සහ මැණික් සහ ඛනිජ නිෂ්පාදිත අපනයන සම්බන්ධයෙනි.